# නිහතමානීභාවය සහ එහි යහපත්කම

[ සිංහල – Sinhala – سنهالي ]

ජාසිම් ඉබ්න් දඉයාන්

2014 - 1435

IslamHouse.com

# صفة الحلم

« باللغة السنهالية »

جاسم بن دعيان

2014 - 1435

IslamHouse.com

# නිහතමානීභාවය සහ එහි යහපත්කම

ජාසිම් ඉබ්න් දඉයාන්

නිහතමානීභාවය යනු කෙනෙක් සමාජ තත්ත්වය, අධ්‍යාපනය, පුරවැසිභාවය, හෝ වර්ණය වැනි ඉතාමත් සුළු හේතූන් මත තමා අන් අයට වඩා උතුම් බව හෝ උසස් බව හෝ නොසිතීමය.

තමා ආගමානුකූල හේතූන් මත අන් අයට වඩා උසස් කෙනෙක් බව කෙනෙකු සිතන්නේ නම්, ඇතැම් අවස්ථාවන් හි එය අනුමත කෙරෙන අතර, ඇතැම් අවස්ථාවන් හි, එය මහත් වගකීමකි. අල් කුර්ආනය නොයෙක් තැන් හි මෙසේ පවසයි. *"(එබැවින්) ගෞරවය අල්ලාහ් සහ ඔහුගේ රසූල් වරයා සහ විශ්වාස කළවුන් සතුය. නමුත් ආත්ම වංචනිකයින් (මෙය) නොදන්නෝය."* සූරා 63: වාක්‍යය 8.

තවත් තැනක *"අහෝ විශ්වාස කළවුනි! ඔබගෙන් යමෙක් ඔහුගේ මාර්ගයෙන් හැරෙන්නේද, ඔවුන් ඔහුට ප්‍රියකරන්නාක් මෙන් අල්ලාහ් ප්‍රිය කරන ජනතාවක් නිපදවන්නේය. ඔවුහු විශ්වාස කරන අය කෙරෙහි නිහතමානීය. විශ්වාස නොකරන අය*

*කෙරෙහි ප්‍රියය. අල්ලාහ්ගේ මාර්ගයෙ හි මනා ලෙස වෑයම් කරන්නෝය. නිගා කරනවුන්ගේ නිගාවට බිය නොවන්නෝය."* සූරා 5: වාක්‍ය 54.

තවත් අවස්ථාවක *"තවද, අන්ධයා හා පෙනුම ඇත්තා සම නොවන්නේය. අඳුර හා ආලෝකය ද සම නොවන්නේය. සෙවණැල්ල හා සූර්යාලෝකය සම නොවන්නේය."* සූරා 35:වැකි 19 සිට 21 දක්වා අල්ලාහ් පවසයි.

නිහතමානීව සිටීම, කිබ්ර් නම් උඩඟුවට සහ උද්ධච්ච කමට විරුද්ධ ස්වභාවයකී. නිහතමානී භාවය මගින් අල්ලාහ්ගේ ආදරය ලැබීමට සහ ස්වර්ගයට පිවිසීමට මාර්ගය විවෘත වන අතර, උඩඟුකම අල්ලාහ්ගේ කෝපයට ලක් කිරීමෙන් අපාය වෙතට ගෙන යයි. මෙම උදාර ගුනාංගයෙන් අලංකාර කර ගන්නා ලෙස නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන්ට අල්ලාහ් කුර්ආනයේ විවිධ තැන් හි අණ කරයි. *"විශ්වාස වන්තයින් අතුරින් නුඹව අනුගමනය කරන්නන්ට නුඹගේ (දයාවේ) පියාපත් හෙළවූ."* සූරා 26: 215.

අල්ලාහ් මෙසේ ද දන්වයි. *"මිනිසුන්ගෙන් නුඹගේ මුහුණ (අහංකාරයෙන්) හරවා නොගනිවූ. මිහිතලයේ උඩඟු ලීලාවෙන් ගමන් නොකරවූ. සැබැවින්ම අල්ලාහ් ගර්වයෙන් යුතුව පුරසාරම් දොඩවන්නන්ට ප්‍රිය නොකරන්නේය."* සූරා 31:18

# නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන්ගේ ආදර්ශය

නිහතමානීභාවයේ ඉතාමත් පැහැදිලි ආදර්ශය අල්ලාහ්ගේ රසූල් සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් විසින් ප්‍රදර්ශනය කරන ලදී. මදීනා නුවර මස්ජිදයෙහි තම සගයන් අතර වාඩි වී සිටින විට, නාඳුනන කෙනෙක් එතැනට පැමිණියහොත් නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් ව හඳුනා ගන්නට නොහැකිව, "ඔබ අතරින්, මුහම්මද් සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් යනු කවුරෙක් දැ?" යි විමසයි. මෙයට හේතුව තම ජනයාගෙන් ඇඳුමෙන් හෝ සැලකිල්ලෙන් කැපී පෙනෙන ආකාරයට එතුමාණන් ජීවත් නොවීමයි. ඉතිහාසයේ වෙනත් කීර්තිමත් පුද්ගලයින් සහ නායකයින් තම ජනයා අතර විශේෂ සැලකිලි ලබන හේතුවෙන් ජන රැල්ල මැද ඔවුන් ව පහසුවෙන් හඳුනා ගන්නට හැකි වනු ඇත.

ක්‍රීඩා කරමින් සිටින කුඩා ළමුන් පසු කර ගෙන යන විට අනස් ඉබ්න් මාලික් රලියල්ලාහු අන්හු තුමා ඔවුන්ට ඉතාමත් උණුසුම් ලෙස හා කරුණාභරිතව සලාම් පවසා ආචාර කරයි. "ඔබ මෙලෙස කරන්නේ කුමක් නිසාදැ?" යි කෙනෙක් එතුමාගෙන් විමසන ලදුව, නබි සල්ලල්ලාහු

අලෙයිහි වසල්ලම් තුමාණන් එසේ කළ බව පිළිතුරු දුන්නේය. (බුහාරි සහ මුස්ලිම්)

අබ්දුල්ලාහ් ඉබ්නු අම්ර් රලියල්ලාහු අන්හු මෙසේ දන්වයි. “මා සිටින ස්ථානයට නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් පැමිණි විට, එතුමාණන්ට වාඩි වීම පිණිස ඉඳි ගසේ කෙඳි පුරවා ගත් සමෙන් මැසූ කොට්ටයක් දුන්නෙමි. එතුමාණන් එය ප්‍රතික්ෂේප කර පොළොව මත වාඩි වී, එම කොට්ටය මා හා එතුමාණන් අතර තැබූහ.” බුහාරි සහ මුස්ලිම්.

අබූ සර්ද් අල් කුද්රි රලියල්ලාහු අන්හු මෙසේ දන්වයි. “දිනක් අල්ලාහ්ගේ රසූල් තුමාණන් සිටින ස්ථානයට මම ගියෙමි. එවිට එතුමාණන් සාමාන්‍යා පැදුරක් මත නැමදුම් කරමින් සිටියහ. එතුමාණන් එම පැදුර මත සජදා කළහ.” මුස්ලිම් වාර්තා කරයි.

අයිෂා රලියල්ලාහු අන්හා තුමියගෙන්, ‘රසූල් සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් සිය නිවසෙහි කරන්නේ කුමක් දැයි විමසූ විට, “එතුමාණන් තම පවුලේ වැඩ කොටස ඉටු කරයි” යනුවෙන් අයිෂා රලියල්ලාහු අන්හා පිළිතුරු දුන්නාය. තම පාවහන් අළුත් වැඩියා කිරීම, ඇඳුමේ ඉරුණු තැන් අණ්ඩ දැමීම, එළුවන් ගෙන් කිරි දෙවීම වැනි ක්‍රියාවන්හි එතුමාණන් නිරත වූ බව එතුමිය පැවසූවාය.

නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් මහලු ඔටුවෙක් මත, දිර්හම් හතරක් හෝ එයට වඩා අඩු මිලට ගත් සෑදලයක වාඩි වී, හජ් කර්තව්‍යය ඉටු කළහ. එම වන්දනා ගමනේ "යා අල්ලාහ්! (මම ඉටු කරන) මෙම හජ් වන්දනාව ප්‍රදර්ශනය කිරීමක් හෝ අපකීර්තිය සෙවීමක් හෝ නැත." යැයි පැවසුහ. තිර්මිදි සහ ඉබ්න් මාජා වාර්තා කළහ. (එම අවස්ථාවේ දී එතුමාණන් ඉස්ලාමිය රාජ්‍යයේ නායකයාව සිටිය.)

"කෙනෙක් නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන්ට යමක් පවසන විට, එම තැනැත්තා (අවසන් කර) ඉවත යන තුරු නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් ඔහුගෙන් මුහුණ හරවනු මම නොදුටුවෙමි. තවද අල්ලාහ්ගේ රසූල් සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන්ගේ අත අල්ලා ගත් කෙනෙක් තම අත පළමුව ඉවත් කර ගන්නා තුරු, එතුමාණන් තම අත ඉවත් කර ගනු මම කිසිවිටෙක නොදුටුවෙමි." යැයි අනස් ඉබ්න් මාලික් රලියල්ලාහු අන්හු දැන්විය. බුහාරි වාර්තා කරයි.

නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් හමු වීමට පැමිණි කෙනෙක් එතුමාණන් ඉදිරියේ අධික ගෞරවය නිසා තැති ගන්වා සිටිනු දුටු නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන්, ඔහුට

“සන්සුන් වන්න.සැබැවින්ම මම රජු කෙනෙක් නොව, කුඩා කැබලි වලට කපා ලුණු දමා වියළන ලද (පරණ) මස් ආහාරයට ගන්නා කුරෙයිෂි කාන්තාවකගේ පුතෙක් වෙමි.” යැයි සහන වදන් කීහ.

එතුමාණන්ගේ නිහතමානීභාවයේ පැහැදිලි ආදර්ශයේ උතුම් අවස්ථාව දැක ගන්නට ලැබුණේ විජයග්‍රාහියා ලෙස මක්කාවට පිවිසී මොහොතේය. දේව විශ්වාසය නොමැති කුරෙයිෂිවරුන්ගේ ඝාතන කිරීමේ තර්ජනය මැද මක්කාවෙන් බැහැර ව එතුමාණන් දේශාන්තර කළ අවස්ථාව ඓතිහාසිකව සිදුවූ සංසිද්ධියකි.

දස වසරකට පසුව එතුමාණන් විජයග්‍රාහකයා ලෙස පිවිසුණු මොහොතේ කුරෙයිෂිවරුන් අන්ත පරජයට පත් ව සිටියහ. එහෙත්, ශුද්ධ වූ මක්කාවේ සීමාවට එතුමාණන් ඇතුළු වූයේ ජයග්‍රහණයේ අහංකාරයෙන් මත් වී හිස ඔසවා ගෙන නොව, යටහත් පහත්කමෙන් ඔටුවාගේ කර මත හිස ගැවෙන තරමට පහත් කර, අල්ලාහ්ගෙන් ලැබූ ජය සඳහා ‘අල්ලාහු අක්බර්“ යනුවෙන් අල්ලාහුවම උත්කර්ෂයට පත් කරමින් ය.

## නිහතමානීත්වය පිළිබඳ නබි වදන්

අබූ හුරෙයිරා රළියල්ලාහු අන්හු මෙසේ දැන්විය. "අල්ලාහ් විසින් කෙනෙකුගේ තත්ත්වය උසස් කිරීම නොලැබ, කිසිවෙක් අල්ලාහ් වෙනුවෙන් නිහතමානීව හැසිරෙන්නේ නැත." මුස්ලිම්.

අබූ හුරෙයිරා රළියල්ලාහු අන්හු මෙසේද දැන්විය. "ධර්මිෂ්ඨභාවය සහිත ගැත්තාට අල්ලාහ් ආදරය කරයි. ඔහු (ගැත්තා) සමෘද්ධමත්ය, (ඔහු සෑහීමට පත් කෙනෙකි) තවද ඔහුව අන් අයට නොපෙනේ. (ඔහුගේ නිහතමානීභාවය නිසා ජනයා ඔහු ගැන නොදනී)." මුස්ලිම්.

අබ්දුල්ලාහ් ඉබ්න් අබ්බාස් රළියල්ලාහු අන්හු මෙසේ දැන්විය. "නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් 'ක්‍රිස්තු බැතිමතුන් මර්යම් තුමියගේ පුත්‍රයා ගැන වැඩි කොට වර්ණනා කළ ආකාරයෙන් ඔබ සැම මා ගැන වැඩි කොට නොපවසන්න. සැබැවින් මම සේවකයෙකි. එනිසා අබ්දුල්ලා සහ රසූලුල්ලාහ් - අල්ලාහ්ගේ සේවකයා සහ අල්ලාහ්ගේ සංදේශකවරයා යනුවෙන් පමණක් පවසන්න.' යැයි" පැවසූ බව උමර් ඉබ්නු අල් කත්තාබ් රළියල්ලාහු අන්හු මිම්බර මත දී ප්‍රකාශ කෙළේය. බුහාරි.

## උමර් ඉබ්නු අල් කෑත්තාබ් රලියල්ලාහු අන්හු තුමාණන් ගෙන් අගනා ආදර්ශයක් මෙසේය:

උර්වා ඉබ්න් සුZබෙයිර් රලියල්ලාහු අන්හු මෙසේ දැන්විය. “දිනක් (රාජ්‍ය නායක) උමර් රලියල්ලාහු අන්හු ජලය පුරවා ගත්, සමින් සාදන ලද විශාල මල්ලක් උරහිස මත තබා ගෙන යනු දුටුවෙමි. එතුමාට ‘විශ්වාසින්ගේ නායක තුමාණනි! ඔබ තුමාණන් මෙය ඔසවා ගෙන යෑම සුදුසු නැත.‘යැයි කීවෙමි. එවිට, “නියෝජිත පිරිසක් මා හමුවීමට පැමිණියහ. ඔවුන් මට දැක්වූ අවනතභාවය දැක, එයින් මගේ සිත් තුළට “නක්වා ” (මමත්වය) ස්වල්පයක් ඇතුළු විය. එය විනාශ කිරීමට මට අවශ්‍යය වී තිබේ. ” යනුවෙන් උමර් රලියල්ලාහු අන්හු කීවේය.

උමර් රලියල්ලාහු අන්හු තුමාගේ ශක්තිමත් පෞරුෂත්වය ගැන ද මිනිසුන්ගේ සිත් තුළ එතුමාගෙන් උපදවන බිය ගැන ද කවුරුත් දනිති. එහෙත් ඉතාමත් අල්ප ප්‍රමාණයක මමත්වය (නක්වා) සිතට ඇතුළු වූ විට එය විසින් තමා විනාශ වීමට පෙර, තමන් එම අහංකාරය විනාශ කිරීමට කඩිනමින් ක්‍රියාකළහ.

ධාර්මික ජනතාවගේ මාර්ගය මෙයයි. මෙවැනි අය නිහතමානී භාවයේ වැදගත්කම හොඳාකරව දන්නා

අතර, කිබ්ර් නම් උඩඟුකමට ලක් වීම ගැන ද හොඳ හැටි දනිති.

"ඉතාමත් අල්ප ප්‍රමාණයක පවා අහංකාරකම සහිත කෙනෙක්, කිසි දිනක ස්වර්ගයට පිවිසෙන්නේ නැත." යැයි නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් පැවසූහ. එතුමාණන් මෙලෙසද ප්‍රකාශ කළහ. "මෙලොවෙහි කිසිවක් උසස් බවට පත් නොකළ යුතු අතර එය බිමට හෙළා දැමීම අල්ලාහ් සතු අයිතිය වේ." බුහාරි.

"මෙලොවේ හෝ මරණයෙන් පසුව හෝ යහපතක් ලබන්නට උත්සාහ කරන්නේ නම්, එම වැයමෙහි නිහතමානීව කටයුතු කිරිමේ හැකියාවෙහි අප ජය ලැබීමේ කොටසක් අඩංගු වී ඇත." යනුවෙන් නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණෝ පැවසූහ. උදාහරණයක් වශයෙන්, කෙනෙක් දැනුම සොයන්නේ නම්, එම අරමුණ කරා දරන වැයෙමෙහි ඔහු නිහතමානීව කටයුතු කළ යුතුය. පොළොවෙහි පහත් භූමිය, විශාල ප්‍රමාණයේ ජලය රැස් කරගන්නා අයුරින් නිහතමානී ශිෂ්‍යයෙක් විශාල දැනුමක් ලබන බව අබ්දුල්ලාහ් ඉබ්න් මආස් රලියල්ලාහු අන්හු දන්වයි

මතු ලොව ගැන අල්ලාහ් මෙසේ පවසයි. "මිහිතලයේ ගර්වය ද කලහකාරිත්වය ද අපේක්ෂා නොකරන වුන්ට මෙම මතු ලොව නිවහන අපි ඇති

කළෙමු. (තීන්දුවේ යහපත්) අවසානය බිය භක්තිකයන්ටය.

සියළු බලසම්පන්න හිමි අල්ලාහ් නිහතමානී වීමේ හැකියාවෙන් අපට තව්ෆීක් කර, කිබ්ර් නම් උඩංගු වීමේ පීඩාවෙන් සහ එහි අහයපත් විපාකයෙන් ආරක්ෂා කර අපහට ආශීර්වාද කරත්වා.